※ මෙම ලිපිය YYYY / MM / DD වන දින අප සේවාවන් ලබන පාරිභෝගිකයින් වෙත යවා ඇත. ඔබ දැනටමත් අප බැංකුවේ ගිණුම් අවලංගු කොට ඇත්නම්, මෙම ලිපියට ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය නොවේ.

YYYY / MM / DD දින

Japan Post Bank, Co., Ltd.

# වර්තමාන නේවාසික කාඩ්පත ඉදිරිපත් කරන ලෙස වූ ඉල්ලීමයි

※අප බැංකු වෙබ් අඩවිය (පහත සඳහන් URL) මගින්, ජපන් භාෂාව හැර වෙනත් භාෂාවලින් වූ නිවේදන ලබාගත හැකි ය.

පාරිභෝගික ඔබගේ සාර්ථකත්වය අපගේ ප්‍රාර්ථනාවයි!

ඔබ නිතරම තැපැල් බැංකුව සහ තැපැල් කාර්යාලය භාවිතා කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙමු.

මෑත වසරවල දී අන්තර්ජාතික ප්‍රජාව තුල, මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා අරමුදල් ලබා දීම වැළැක්වීමේ පියවරවල වැදගත්කම වැඩි වෙමින් පවතී. එබැවින්, ජපානය තුල ඇති එක් එක් මූල්‍ය ආයතන විසින් අදාළ අමාත්‍යාංශ ආදිය සමඟ සම්බන්ධ වී, විවිධ ක්‍රියාමාර්ග ගනිමින් ශක්තිමත් මූල්‍ය පද්ධතියක් පවත්වා ගෙන යාමට උත්සාහ කරනු ලබයි. ඉන් එක් ක්‍රියාමාර්ගයක් ලෙස, අප බැංකුවේ ද, නව ගිණුමක් ආරම්භ කරන පාරිභෝගිකයින්ට අමතරව, දැනටමත් ගිණුම් පවත්වා ගෙන යන පාරිභෝගිකයින් සඳහා ද නේවාසික කාඩ්පතෙහි සඳහන්, ජපානයේ රැඳී සිටිය හැකි කාල සීමාව (රැඳී සිටිය හැකි අවසන් දිනය) සම්බන්ධයෙන් වරින් වර අඛණ්ඩව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලබයි.

එබැවින්, ඔබේ පහත සඳහන් ගිණුමට අදාළව, පහත සඳහන් ක්‍රම මගින් පිළිතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු. ඒ සඳහා ඔබට සිදු වන අපහසුතාවට කනගාටු වන්නෙමු.

| | |
|---|---|
| අදාළ ගිණුමේ සංකේත අංකය<br>(සාමාන්‍ය (ඉතුරුම්) තැන්පතු<br>හෝ මුදල් හුවමාරු ගිණුම) | ＊＊＊＊＊－＊＊＊＊○○○○<br>(අවසාන ඉලක්කම් 4 පමණක් සඳහන් කෙරේ) |
| ප්‍රතිචාර කාලසීමාව | YYYY / MM / DD දින |

අප බැංකුව මගින් ඔබගේ වටිනා වත්කම් ඉදිරියටත් නොකඩවා භාර ගන්නා අතර, ඔබ අප සමඟ සුරක්ෂිතව හා ආරක්ෂිතව ගනුදෙනු සිදු කර ගෙන යනු ඇතැයි බලාපොරොත්තු වෙමු. මෙය ඒ සඳහා කෙරෙන වැදගත් පියවරක් වන බැවින් ඔබ දක්වන සහයෝගය ඉහලින් අගය කරන්නෙමු.

**තවද, නියමිත කාලසීමාව තුල දී ප්‍රතිචාර නොලැබෙන්නේ නම්, මෙම බැංකුවේ රෙගුලාසිවලට※ අනුව, ඔබෙන් ප්‍රතිචාර ලැබෙන තෙක්, ගිණුමේ ඇතැම් සේවාවන් භාවිතා කල නොහැකි වන අවස්ථාවන්ද ඇත. කරුණාකර කල් ඇතුව දැනුවත් වන්න.**

※ සාමාන්‍ය ඉතිරි කිරීමේ රෙගුලාසි 13-2, 3 වන ඡේදය, මුදල් හුවමාරු තැන්පතු ගිණුම් රෙගුලාසි 28-2, 3 වන ඡේදය යනාදිය

ස්තුතියි

පිළිතුරු සපයන ආකාරය ------------------------------------------------------------------------------------------------

ස්මාර්ට් ජංගම දුරකතනයක් හෝ පරිගණකයක් මගින්, අප බැංකු වෙබ් අඩවිය (පහත කොටස) → "පාරිභෝගික තොරතුරු ලබාදීම යනාදිය සඳහා කෙරෙන ඉල්ලීම" පිටුවෙහි※ සඳහන් ලින්ක් එක මගින් "තැපැල් බැංකුව, පාරිභෝගික තොරතුරු ලබාදෙන වෙබ් අඩවිය" වෙත පිවිස, වර්තමාන නේවාසික කාඩ්පතෙහි පින්තූරයක් අප්ලෝඩ් කරන්න.

පිවිසීම සඳහා අවශ්‍ය ID එක සහ මුරපදය පහත පරිදි වේ.

(දකුණු පස ඇති ද්විමාන කේතය ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනය මගින් කියවීමෙන්, ඔබගේ ID එක සහ මුරපදය ඇතුළත් නොකරම ඇතුළු විය හැක.)

[ID] ************

[මුරපදය] ************

※(URL) https://www.jp-bank.japanpost.jp/honnin/hn_zct.html

(තොරතුරුවල ආරක්ෂාව සඳහා, ඇතැම් විස්තර ගුප්තකේතනය (එන්ක්‍රිප්ට්) කර ඇත.)

※ ඔබට ස්මාර්ට් ජංගම දුරකතනයක් වැනි දෑ නොමැති නම් හෝ වෙනත් හේතුවක් මත ස්මාර්ට් ජංගම දුරකතනයක් වැනි දෑ මගින් පිළිතුරු සැපයීමට අපහසු නම්, කරුණාකර පහත සඳහන් විමසීම් මධ්‍යස්ථානය වෙත අමතන්න.

| | |
|---|---|
| විමසීම | තැපැල් බැංකු සමාගම,<br>පාරිභෝගික තොරතුරු කළමනාකරණ මධ්‍යස්ථානය<br>දුරකථන 0120-340-004<br>< විවෘත වේලාව > සතියේ දින 9:00 ～ 19:00<br>සෙනසුරාදා, ඉරිදා සහ නිවාඩු දින 9:00 ～ 17:00<br>(දෙසැම්බර් 31 වන දා සිට ජනවාරි 3 වන දා තෙක් භාවිතා කල නොහැක) |